


# මෛත්‍රී භාවනාව

ප්‍රධාන භාවනාවට පෙර සිදු කැරෙන චතුරාරක්ඛ භාවනාවේ පළමුවැන්න වූ බුදුගුණ භාවනාවේ යෙදුණු මගේ සිත මහත් සැහැල්ලුවකින් පිරිණ.

'නමාමි බුද්ධං ගුණසාගරන්තං' බුදු රජාණන් වහන්සේගේ ගුණ සාගරයකි. මා සිහි කළේ එයින් බිඳක් පමණි. අරහං ගුණයෙනුත් ස්වල්පයකි.

'කෙලෙසුන්ගෙන් තොර වීම අරහං ගුණයේ එක අංගයක්, රාගය කෙලෙසුන්ට අයිති ය. බුදු පියාණන් වහන්සේ රාගයෙන් තොරයි, ' සිතූ මම උන් වහන්සේගේ රාගයෙන් තොර වූ ආකාරය සිහි කළෙමි. ගිහි කල ලැබුණු සියලු සම්පත්, ඒ සුඛෝපභෝගී ජීවිතය අත්හළ හැටි, බුදු වූ පසු ලැබූ ආරාම දාන මාන ඇලීමෙන් බැඳීමෙන් තොරව පිළිගත් හැටි, දුක සැප සම ව උපේක්ෂාවෙන් ඉවසූ හැටි මම සිහි කළෙමි.

අසූ හැවිරිදි මහලු වයසේ සිටිය ද දිරාපත් වූ රථයකට සිය සිරුර සම කළ ද විශාලාවේ සිට කුසිනාරාව දක්වා තුන් මසක් පුරා පා ගමනින් ම වැඩම කළ හැටි, ගුවනින් ඍද්ධි බලයෙන් පහසුවෙන් යා හැකි ව තිබුණ ද ඒ දුක් පීඩා ඉවසමින් මඟ දිගට ආනන්ද හාමුදුරුවන් හතරට නමා දෙන සිවුර මත විටින් විට වැඩ හිඳීමෙන් 'මහ මහන්සියි ආනන්ද' යනුවෙන් වදාළ හැටි මට සිහි විය.

මගේ දෑස කඳුලෙන් පිරිණි. ඇලීමෙන් බැඳීමෙන් තොර වූ උත්තම ජීවිතය සතු ගුණ සාගරයෙන් බිඳක් හෝ උරාග ැනීමට මගේ සිතට ද හැකි වේවා෴ මම රාගයෙන් තොර වෙමි. ද්වේෂයෙන් තොර වෙමි. මෝහයෙන් තොර වෙමි: කෙලෙසුන්ගෙන් තොර වෙමි. මාගේ බුදු පියාණන් වහන්ස, මම ද ඔබ වහන්සේ හෙළි කළ මාර්ගයේ ගමන් කොට කෙලෙසුන් කෙරෙන් තොර වෙමි.
මේ සිතිවිලි සමඟ මගේ හද මැඳුර බුදු මැඳුරක් විය. බුදු හිමියෝ එහි වැඩ සිටිති.
මගේ සිත නිහඬ විය. ශාන්ත විය. මට මගේ සිරුර නොදැනී ගියේය.
මම යළි හද මැදුරේ බුදු රුවට යොමු වූයෙමි. උන් වහන්සේ ද්වේශයෙන් තොරයි. සියලු දෙනාට ම සම මෙත පැතිරූ හ.
මම ද මුළු ලොවටම සම මෙත පතුරුවමි. මම චතුරාරක්ඛ භාවනාවේ දෙවන භාවනාවට සිත යෙදුවෙමි.

මම තරහ නොවෙමි. සුවපත් වෙමි. තරහ ඇති විට ඇති වන තත්ත්වය සිහි කළෙමි.

මට තරහ ඇති වූ අවස්ථා කීපයක්, මගේ ඇඟ ගැහෙන්නට වුණා: දෙතොල වෙවුළුවා: ඇස් පුපුරන්නට වගේ වුණා. හද ගැස්ම වැඩි වුණා: අත්මිට මෙළවුණා: පරුෂ වචන කීපයක් මුවින් පිට වුණා. මට මා පාලනය කරගන්න අපහසු වුණා.

ඒ හැසිරීම ගැන මට මා ගැන ම පසු ව දුකක් ඇති වුණා. ලොකු හාමුදුරුවන් ඇතුළු මාගේ වැඩිහිටියන්ගෙන් දොස් අසන්නට සිදු වුණා. මේ සියල්ල සිදු වූයේ සිතට ආ තරහ නිසා, තරහ නිසා සිත දැවෙනවා. තරහ නැති සිත සන්සුන්, ශාන්තයි. සතුටුයි.
ඇයි මා කෙනෙකු සමඟ තරහ වන්නේ? තරහ වීමෙන් පාඩුව මට ම යි. තරහ වීම පවක්. තරහ වීමෙන් පව් පිරෙන්නේ මට ම යි. තරහ වීම නිවනට බාධාවක්.

මම තරහ නොවෙමි. සුවපත් වෙමි. තරහ නොවෙමි. සුවපත් වෙමි. තරහ නොවෙමි.
සුවපත් වෙමි. තරහ නොවෙමි. සුවපත් වෙමි. මටත් වඩා මට හිතවත් අය තරහ නොවෙත්වා ෴ සුවපත් වෙත්වා ෴ තුන් වරක් එසේ සිතුවෙමි.

මටත් වඩා මට අහිතවත් අය තරහ නොවෙත්වා ෴ සුවපත් වෙත්වා ෴ මට එරෙහි ව ලොකු හාමුදුරුවන් ට කේළම් කියූ පොඩි හාමුදුරු නම මට සිහි විය. ලොකු හාමුදුරුවන් ඉවසිල්ලෙන් ක්‍රියා කළ නිසා මා නිවරදි බව ඔප්පු විය. මගේ සිත ඒ මොහොතේ තරහෙන් පිරී තිබිණි. අදත් පොඩි හාමුදුරුවෝ මා සමඟ කතා නො කරති. අහිතවත් වෙනත් කෙනෙක් නැත. අර පොඩි හාමුදුරුවෝ තරහ නො වෙත්වා෴ සුවපත් වෙත්වා ෴ තුන් වරක් සිතුවෙමි. මගේ සිත තුළ ඒ පොඩි හාමුදුරුවන් සිනාමුසු ව සිටිනු පෙනිණ. ඒ තරහ මුළුමනින් ම නික්ම දුරු වෙලා.
මටත් වඩා මා පිළිබඳ මැදහත් අය ම තරහක් නැති හිතවත් කමකුත් නැති මැදහත් අය තරහ නො වෙත්වා ෴ සුවපත් වෙත්වා ෴ තුන් වරක් සිතුවෙමි.
මේ ආරාමයේ පැවිදි පිරිස, ගමේ දායක පිරිස, මේ පළාතේ සියලු දෙනා, රටවැසියන් සියලු දෙනා, පෘථිවියේ සියලු සත්ත්වයෝ තරහ නොවෙත්වා ෴ සුවපත් වෙත්වා ෴ තරහ නොවෙත්වා ෴ සුවපත් වෙත්වා ෴ තරහ නොවෙත්වා ෴ සුවපත් වෙත්වා ෴
මේ පෘථිවියේ වසන සියලු සත්ත්වයෝ, ජලයේ වාසය කරන සියලු සත්ත්වයෝ, අහසේ සිටින සියලු සත්ත්වයෝ, තරහ නො වෙත්වා ෴ සුවපත් වෙත්වා ෴ තරහ නොවෙත්වා ෴ සුවපත් වෙත්වා ෴ සුවපත් වෙත්වා ෴ තරහ නොවෙත්වා ෴ සුවපත් වෙත්වා ෴

මම සිතින් අහසට නැඟුණෙමි. ඈත ඉහළ සිටින මට පෘථිවිය පෙනේ. එහි ජීවත් වන සියලු සත්ත්වයන් පෙනේ. මගේ හදවත මෛත්‍රියේ සිහිල් පැන් පිරවූ භාජනයක්. ඒ මෛත්‍රියේ සිහිල් පැන් පහත පෙනෙන පෘථිවියට ඉසිමි. සියලු සත්ත්වයන්ගේ සිත් ඒ සිහිල් පැන්වලින් නැහැවෙයි. සිත්වල වූ තරහවේ ගිනි නිවී සිත් සුවපත් වෙයි. මුළු ලොව ම මෛත්‍රියෙන් පිරෙයි. මුළු ලොව ම සුවපත් වෙයි. මුළු ලොව ම සුවපත් වෙයි. සුවපත් වෙයි...

සැම තැන ම මෛත්‍රිය, තරහක් නැහැ. වෛරයක් නැහැ, පළි ගැනීම් නැහැ, තුවක්කු - කඩු - බෝම්බ නැහැ. මුළු ලෝකයම මුළු පෘථිවියම මෛත්‍රියෙන් පිරිලා, සුවපත් බවෙන් පිරිලා, සෑම තැනම මෛත්‍රිය -මෛත්‍රිය - මෛත්‍රිය.

සමන් පිච්ච මලේ සුදු පැහැයෙන් මුළු ලොව ම වැසී යනු පෙනෙනවා. පැහැපත් ලොවක් මට පෙනෙනවා. මගේ සිත ශාන්ත බවේ ගැඹුරට ම පිවිසිලා.

## හැමෝම පිනවීම

ඒබ්‍රහම් ලින්කන්ගේ ජයග්‍රහණය සදහා ඉතා මහන්සිවී වැඩ කල පීටර් නමැති පුද්ගලයෙක් ලින්කන්ට නම් ලැයිස්තුවක් ඉදිරිපත් කලේය.

ලින්කන්-- මොකද්ද මේ?
පීටර් -- සර් මේ අපිට විරුද්ධව චන්දෙදි වැඩ කරපු එවුන්ගෙ නම් ටික.මුන් සේරම ඈත පලාත් වලට මාරු කරන්න ඕන සර්.
ලින්කන්-- කෝ ගන්න බලන්න, මේක හොද වැඩක්.මන් මේක අදම කරන්නම්..

පසු දිනෙක ලින්කන්ගේ කාර්‍යාල සහායකයා කුණු කූඩය අස් කරද්දී තමා දුන් ලැයිස්තුව කුණු කූඩයේ තිබෙනු ඒ අසල සිටි පීටර් දුටුවේය.
කෝපයට පත් ඔහු වහා ලින්කන් හමුවිය.
පීටර් -- සර්........
ලින්කන් --ඇයි පීටර්
පීටර් -- සර් අර මම කියපු මිනිස්සු ටික මාරු කළේ නැහැ නේද?
ලින්කන් -- මොන මිනිස්සුද පීටර්?
පීටර් -- අර මන් ලිස්ට් එකක් දුන්නෙ,අපිට විරුද්දව වැඩ කරපු අය, මම දැක්ක ඒ ලිස්ට් එක කුණු කූඩෙ තියනවා.
ලින්කන් -- ආ...... මං ඒ කට්ටිය මාරු කළේ නෑ.
පීටර් -- ඒ මොකද?
ලින්කන් -- එහෙම කළා නං ඒ අයගෙ හිත නරක් වෙනවනෙ.
පීටර් -- එහනං එදා බාරගත්තෙ එවෙලෙම කරනව කියල.
ලින්කන් -- එහෙම එදා කිව්වෙ නැත්තං පීටර්ගෙ හිත නරක් වෙනවනෙ.



## නැණ පැණ හරි පාර හොයන්න



රජතුමාට එකිනෙකට ආසන්නව මන්දිර දෙකක් ඇත.මෙම මන්දිර සහිත භූමියට ඇතුළු වන ප්‍රධාන මුර කපොල්ලේ මුරකරුවන් දෙදෙනෙකි. මින් එකෙක් හැම විටම බොරු කියන අතර අනෙකා හැම විටම ඇත්ත කියයි. මේ ගැන දන්නා පිටස්තර පණිවිඩ කරුවෙකු බොරු හෝ ඇත්ත කියන්නා කව්දැයි නොදනී. මින් එක් මුර කරුවෙකුගෙන් අසා හරියටම රජු සිටිනා මන්දිරය කුමක්දැයි සොයා ගත්තේ කෙසේද? පිළිතුර ලබන කළාපයේ.